## ජෙයරාජ් ගජබින්නාලංකාරයෙන් හෙළිවන සැලැස්ම

හොඳ හොඳ නැටුම් එළිවෙන ජාමෙට කීවාක් මෙන් ඩී බී එස් (ඩේවිඩ් බුල් සබාපති) ජෙයරාජ් නම් දෙමළ ජාතිවාදී ජනමාධ්‍යවේදියකු සුදු කොඩි පිළිබඳ මූලික වාර්තාවක් ඔහුගේ වෙබ් අඩවියෙන් ඉදිරිපත් කර ඇත. එය මේ දිනවල ඉලෙක්ට්‍රොනික තැපෑලෙහි ද සංසරණය වෙයි. ඔහුට අනුව අපට ඒ පිළිබඳ වඩා සවිස්තර වාර්තාවක් ඉදිරි කාලයේ දී බලාපොරොත්තු විය හැකි ය. ඔහුගේ වාර්තාවෙහි අඩංගු කරුණු ගැන කෙටියෙන් වුවත් සඳහන් කර ඒ ගැන විවේචනයක් ඉදිරිපත් කිරීමට පෙර ඔහු ගැන යමක් සඳහන් කළ යුතු ය. දෙමළ ක්‍රිස්තියානි භක්තිකයකු වූ ජෙයරාජ් කලකට පෙර අයිලන්ඩ් පුවත්පතට ද ලිවී ය. ඔහු කොට් සංවිධානයේ හිතවතකු වූ බව රහසක් නො වේ. පසුව ඔහු කැනඩාවට ගිය බවත් එහි දී පශ්චාත් උපාධියක් සඳහා කටයුතු කරන බවත් ප්‍රසිද්ධ විය. තවත් කලකට පසුව දැනගැනීමට ලැබුණේ ඔහු හා කොටි සංවිධානය අතර මතභේද ඇතිවී කොටින්ගෙන් ඔහුට තර්ජන එල්ල වී ඇති බවත් ය. ඒ කිනම් කරුණක් අරභයා දැයි දැනගැනීමට නැතිවුවත් ඒ ඊනියා මතභේද මැද ද ඔහු දෙමළ ජාතිවාදය වෙනුවෙන් පෙනී සිටියේ ය. අද ලෝකය පුරා විසිරී ඇති ඉංගිරිසි කතාකරන දෙමළ ජාතිවාදීන් අතර ඔහු ද ප්‍රධානියෙක් විය. අප බොහෝ විට කියා ඇත්තේ දෙමළ ජාතිවාදය ලන්දේසීන්ගේ හා බ්‍රිතානීන්ගේ නිර්මාණයක් බවත් විශේෂයෙන් ම ඉංගිරිසි කතාකරන දෙමළ ජාතිවාදීන් සිංහලත්වයට එරෙහිව බ්‍රිතානීන් විසින් එදත් අදත් යොදාගනු ලැබූ බවත් ය. ප්‍රභාකරන්ගේ මරණයෙන් පසුව අද බටහිරයන්ට ඉතිරි වී ඇත්තේ විසිරී ඇති දෙමළ ජාතිවාදීන් ය. බටහිරයන් අද නිරර්ථක උත්සාහයක යෙදෙන්නේ ආණ්ඩුවට විරුද්ධව ඊනියා යුද්ධාපරාධ චෝදනා ඉදිරිපත් කර, රටේ අවුල් ඇති කර හැකිනම් විසිරී ඇති දෙමළ ජාතිවාදීන් (ඊනියා ඩයස්පෝරාව) මගින් මුහුදින් එතර ඊළමක් පිහිටුවීමට ය. බටහිරයෝ ජනාධිපතිවරණය, ජ වි පෙ හා සරත් ෆොන්සේකා ඒ සඳහා යොදා ගනිති.

ජෙයරාජ්ට අනුව නඩේසන් හා පුලිදේවන් හමුදාවට භාරවීම සඳහා ආණ්ඩුවේ ඉහළ ම පුද්ගලයන් සමග කුප්‍රසිද්ධ නම්බියාර් ද ඇතුළු විවිධ පුද්ගලයන් මගින් සාකච්ඡා කර ඇත. ඔහුට අනුව ආණ්ඩුව භාරවීම සඳහා අනුමැතිය ලබා දී ඇති අතර ත්‍රස්තවාදීන් ඒ සඳහා 58 වැනි බල සේනාංකය තෝරාගෙන ඇත. මැයි 18 වැනි දා පාන්දර නඩේසන් හා ඔහුගේ බිරිඳ (ඇගේ දෙමව්පියන් සිංහල නමුත් ඇගේ තෝරාගැනීම අනුව සංස්කෘතියෙන් ඈ දෙමළ වී ඇත), පුලිදේවන් හා තවත් 15 දෙනකු පමණ එක් කණ්ඩායමක් ලෙසත් ඔවුන් පිටුපස රමේෂ් ඇතුළු පිරිසක් තවත් කණ්ඩායමක් ලෙසත් භාරවීම සඳහා පැමිණ ඇත. ජෙයරාජ්ට අනුව ආරක්ෂක ලේකම්වරයා හමුදාපතිට එදින පාන්දර 3.30ට පමණ භාරවීම දැනුම් දී ඇති අතර හමුදාව නඩේසන් ඇතුළු පිරිස භාරගැනීමට සූදානමින් සිට ඇත.

ජෙයරාජ්ට අනුව දහ අටවැනි දා පාන්දර නඩේසන් හා පුලිදේවන් වේට්ටිවලින් කපා සකස්කර ගන්නා ලද සුදු කොඩි රැගෙන පැමිණ ඇති නමුත් ඔවුන් ගොස් ඇත්තේ 58 වැනි බල සේනාංකය වෙතට නොව ඉන් ඔබ්බෙන් සිටි විශේෂ බලකාය වෙත ය. තමන් පැමිණියේ භාරවීමට බව පැවසූ විට විශේෂ බලකාය නඩේසන් හා පුලිදේවන් වෙනමත් අනෙක් පිරිස වෙනමත් දණ ගස්වා නඩේසන්ගෙන් හා පුලිදේවන්ගෙන් ප්‍රශ්නකිරීම අරඹා ඇත. එහෙත් නොසන්සුන් වූ භටයන් ඔවුන්ට වෙඩි තැබීමට යන බව දැනගත් නඩේසන්ගේ බිරිඳ ළතෝනි දීමට පටන්ගෙන ඇත. එහි දී හමුදා භටයන් ඇයට අමු තිත්ත කුණු හරුපයෙන් බැණ වැදී ඇත. ඒ සමග විශේෂ හමුදා භටයන් නඩේසන්ට හා පුලිදේවන්ටත් අනෙක් අයටත් වෙඩි තබා ඇත. පසුව නිලධාරීන්ගේ මැදිහත්වීමෙන් වෙඩි තැබීම නවතා ඇති අතර කිහිප දෙනකු හමුදාභාරයට ගෙන ඇත. ජෙයරාජ්ට අනුව පසුපසින් පැමිණ මේ සියල්ල දුටු රමේෂ් ඇතුළු පිරිස ආපසු කොටි ගුබ්බෑයමට දිවගොස් සටන් අරඹා ඇත. එහෙත් පසුපසින් පැමිණි හමුදා භටයන් සමග සටන් කළ රමේෂ් හා ඉලංගෝ ගුබ්බෑයමේ සිටියවුන්ට නායකත්වය දෙමින් වීරෝදාරව මිය ගොස් ඇත.

ජෙයරාජ්ගේ ගජබින්නාලංකාරය ඇතැම් සිංහල ව්‍යාජ උගතුන් විසින් පිළිගැනෙනු ඇත. ව්‍යාජ මැදහත් බවක් ප්‍රදර්ශනය කරන මේ පුස්සන්ට ජෙයරාජ්ගේ ප්‍රකාශය මධ්‍යස්ථ ලේඛකයකුගේ අනඟි හෙළිදරව්කිරීමක් විය හැකි ය. එහෙත් අපට නම් මෙහි පරස්පර කොතෙකුත් ඇත. ඒ කිහිපයක් සඳහන් කිරීමට පෙර ජෙයරාජ් රමේෂ්ගේ ඊනියා වීරෝදාර මියයෑම ගැන කරන ප්‍රකාශය අපේ අවධානයට යොමු විය යුතු ය. ඔහුගේ දෙමළ ජාතිවාදය හෝ කොටි පක්ෂපාතීත්වය හෝ අඩු වී නොමැති බව පෙනී යයි. ඔහුට අවශ්‍ය කෙසේ හෝ කවදා හෝ හමුදාවේ ඇතැම් නිලධාරීන් (ජාත්‍යන්තර) යුද්ධාධිකරණයක් ඉදිරියට ගෙන යෑම ය. වඩාත් භයානක වන්නේ මෙවැනි බේගල්කරුවන් (ශාස්ත්‍රීය බේගල්) ජනාධිපතිතුමාගේ දෙවැනි ජයග්‍රහණයෙන් පසුව ආණ්ඩුවේ වැදගත් තනතුරුවලට පත්වීමට ඉඩකඩ තිබීම ය.

© Prof. Nalin De Silva

පළමුව දයා මාස්ටර්ට පමණක් නොව ප්‍රභාකරන්ගේ දෙමව්පියන්ට ද භාරවීමට අවස්ථාව සලසා දුන් හමුදාව නඩේසන් නඩේට ඒ අවස්ථාව නුදුන්නේ ඇයි ද යන්න ය. ජෙයරාජ්ට අනුව ආණ්ඩුව ඒ සඳහා ඉඩ දීමට සූදානම් ව සිටි නමුත් විශේෂ හමුදා බලකාය එයට හරස් වී ඇත. නඩේසන් ඇතුළු පිරිස දහඅටවැනි දා පාන්දර ඔය කියන වේට්ටිවලින් සකස් කරන ලද සුදු කොඩි රැගෙන පැමිණියෝ ද? ඒ පාන්දර සුදු කොඩි පෙනෙන්නට තිබිණි ද? අහඅටවැනි දා වන විට ත්‍රස්තවාදීන් සිවිල් වැසියන්ගේ වෙසින් පැමිණ සටන් කර ඇති බව ජෙයරාජ් වුවත් පිළිගනියි. නඩේසන්ට 58 වැනි හමුද බලකායට භාරවීමට උපදෙස් දී තිබුණි නම් ඔවුන් විශේෂ බලකාය දෙසට ගියේ ඇයි? විශේෂ බලකායට ඔවුන්ගේ ඊනියා භාරවීම දැනුම් දී තිබුණි ද? නඩේසන්ගේ බිරියට තිත්ත කුණු හරුපයෙන් බැණ වැදුණු බව ජෙයරාජ් දැනගත්තේ කාගෙන් ද? නඩේසන් සමග පැමිණි පිරිස එක්කෝ මිය ගොස් ය. නැත්නම් දැන් හමුදා භාරයේ ය. රමේෂ් ඇතුළු පිරිස ඒ කුණුහරුප ඇසෙන මානයක සිට නොමැති බව පැහැදිලි හෙයින් කුණුහරුප කියන්නේ ජෙයරාජ් මිස වෙනත් අයකු විය නො හැකි ය. එහෙත් මෙයටත් වඩා ප්‍රශ්නය වන්නේ ආයුධ නොමැතිව පැමිණියේ යැයි කියන රමේෂ් හමුදා භටයන් සමග සටන් කෙළේ කෙසේ ද යන්න ය. ඔහු ආපසු කොටි ගුබ්බෑයමට ගොස් එහි සිටි පිරිසට නායකත්වය දෙමින් සටන් කෙළේ ය යන්න පිළිගත නො හැකි ය. ඔහු ආපසු ගුබ්බෑයමට දිව යැමට පළමුව ඔහුට වෙඩි තැබීමට හමුදාවට නො හැකි වී ද? ජෙයරාජ්ගේ ගජබින්නාලංකාරයට අනුව වුවත් මෙහි දී සිදු වී ඇත්තේ වෙනත් දෙයක් ද? නඩේසන් හා පුලිදේවන් අයත්වූයේ කොටින්ගේ සන්නද්ධ නොවන අංශයට ය. පුලිදේවන් ඊනියා සාම ලොක්කා වූ අතර නඩේසන් ඊනියා පොලිස් ලොක්කා විය. නඩේසන්ගේ බිරිඳ ගියේ පරිවර්තන කටයුතු සඳහා යැයි ජෙයරාජ් කිව ද හමුදාවේ දෙමළ දන්නා නිලධාරීන් සිටින අතර ඒ වන තුරු පරිවර්තන කටයුතු සඳහා කිසිම කොටි ත්‍රස්තවාදියකුගේ සහාය හමුදාවට අවශ්‍ය වී නැත.

රමේෂ් යනු සන්නද්ධ අංශයේ නැගෙනහිර පළාතේ නායකයා ය. ඔහු ආයුධ සන්නද්ධ ව සිටි බව ජෙයරාජ්ට වසංකළ නො හැකි ය. ගජබින්නාලංකරයෙන් කියැවෙන්නේ ඔහු ආපසු දිවගොස් සටන් කළා නොව තම උපාය වැරදී ඇති බව දැන එතැන ම සටන් කර ඇති බව ය. නඩේසන් හා පුලිදේවන් පෙරටුකරගෙන රමේෂ් ඇතුළු පනහක් පමණ ගොස් ඇත්තේ වෙනත් කරුණක් සඳහා ය. බටහිරයන්ගේ උපකාරයෙන් මුළු ලෝකයට ම හැමදාමත් බොරු කළ කොටි නාටකයේ අවසන් මොහොතේ දී ද ඔවුන්ගේ ආධාරයෙන් බොරුකර ඇත් ද?. ජෙයරාජ්ගේ ගජබින්නාලංකාරයෙන් අපට පෙනී යන කරුණ නම් මේ සියල්ල ඊනියා යුද්ධ අපරාධ චෝදනා නැගීම සඳහා සැලසුම් කරන ලද ජවනිකාවක් විය හැකි බව ය.

රමේෂ් හා පිරිස පැමිණ ඇත්තේ ම හමුදාව සමග සටනකට එළඹීම සඳහා ද?. ඒ ජයග්‍රහණය කිරීම සඳහා නොව හමුදාවට චෝදනා එල්ල කිරීමට ද?. නඩේසන් නඩේ පිටුපසින් ආයුධ සහිතව පැමිණ ඇති මේ පිරිස කලින් කතාකර ගත්තේ යැයි කියන පරිදි 58 වැනි බල සේනාංකය දෙසට නොගොස් විශේෂ බලකාය දෙසට ගොස් ඇත්තේ හමුදාව සමග සටන්කිරීමට ද? නැත්නම් භාරවීමට ද? බරහිරයන්ගේ අනුදැනුම ඇතිව භාරවීමක් රඟ දක්වා රමේෂ් මැරුම් කෑමට ම ගියේ ද?. ඇතැම්විට නඩේසන් හා පුලිදේවන් ද ඒ බව දැනසිටියෝ ද?. ඔවුන් අත ආයුධ නොතිබෙන්නට ඇත. එහෙත් අපි එය නිසැකව නො දනිමු. ජෙයරාජ්ගේ වාර්තාවෙන් රමේෂ් ඇතුළු පිරිස නම් ආයුධ සන්නද්ධ ව සිටි බව පැහැදිලි වෙයි. විශේෂ බලකාය වැඩි ප්‍රශ්න කිරීමකින් තොරව ම උපක්‍රමය හෙළිදරවු කර ගත්තේ ද?. එසේත් නැත්නම් රමේෂ් ඇතුළු පිරිස දුර සිට වෙඩි තැබුවේ ද?. කෙසේ වුවත් සියල්ල සැලසුම් කෙරී ඇත්තේ භාරවීමට බැරි වුවහොත් නිරායුධ ව සුදු කොඩියක් රැගෙන භාරවීමට පැමිණි පිරිසකට හමුදාව වෙඩි තැබීය යන අදහස ලෝකයට එත්තු ගැන්වීමට ය. තමන් ගේ සුරතලා වූ කොටි පරාජය වීමට යන බව දත් බටහිරයන් ඊනියා භාරවීමක් සැලසුම් කෙළේ ද? භාරවීම සාර්ථක වී නම් නඩේසන් ලා මගින් ප්‍රභාකරන් ද නිදහස් කර ගැනීමටත් ඉන්පසු මුහුදින් එතර ඊළමක් පිහිටුවීමටත් කටයුතු කිරීමට තිබිණි ද?. භාරවීම අසාර්ථක වී නම් රමේෂ්ලා ලවා වෙඩි තබ්බවා ආණ්ඩුවට හා හමුදාවට එරෙහිව යුද්ධාපරාධ පිළිබඳ චෝදනා ඉදිරිපත් කිරීමට සැලසුම් කර තිබිණි ද? මේ පිළිබඳ තව තවත් තොරතුරු ඉදිරි කාලයේ දී හෙළිදරවු වනු ඇත. ජෙයරාජ් ලා ලියන ගජබින්නාලංකාර අපට තව තවත් ප්‍රයෝජනවත් වනු ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva